පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.09 පැය 1120 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2023/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන වාහන 03ක් පොලිස් භාරයට ගැනීම - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අයිස් මත්ද්‍රව්‍ය නිෂ්පාදනයට ගනු ලබන රසායනික ද්‍රව්‍ය බහාලුම් 02ක් සන්තකයේ තබා ගැනීම හා අවි ආයුධ ජාවාරම් කිරීම සම්බන්ධයෙන් දැනට රැඳවුම් භාරයේ සිටින සැකකරුවෙකු විසින් මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා ලද මුදලින් මිලදී ගන්නා ලද බවට සැකකරන බස් රථයක්, කැබ් රථයක් හා කාර් රථයක් විමර්ශන නිලධාරීන් භාරයට ගෙන ඇත.

**බස් රථය හා කැබ් රථය සූක්ෂමව විකිණීම සඳහා සූදානම් කිරීමක් සම්බන්ධයෙන් ලද තොරතුරක් මත 2025.11.07 වන දින තලාව දකුණ, කන්තෝරුවත්ත ප්‍රදේශයේදී ද,** කාර් රථය 2025.11.08 වන දින ඇඹිලිපිටිය පොලිස් ස්ථානය භාරයේ තිබියදී ද මෙසේ විමර්ශන නිලධාරීන් භාරයට ගෙන ඇත.

ඉහත වාහන **මත්ද්‍රව්‍ය ජාවාරම් හා නීති විරෝධී කටයුතු සඳහා යොදා ගෙන ඇත්ද යන්න සම්බන්ධයෙන්** වැඩිදුර විමර්ශන සිදු කරනු ලබන අතර ඉදිරි විමර්ශන කටයුතු සඳහා මෙම වාහන නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය වෙත භාර දීමට නියමිතව ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**